සියළු ම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved
ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone

ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone

71 | S | II

අවසාන වාර ඇගයීම - 2024
Last Term Evaluation - 2024

| | | | | | |
|---|---|---|---|---|---|
| ශ්‍රේණිය Grade | 13 | විෂයය Subject | සිංහල II | කාලය Time | 3 hours |

උපදෙස්

- I කොටසේ 1 ප්‍රශ්නයද, II කොටසේ 2,3 ප්‍රශ්න ද ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න
- I කොටසේ ඇති සියලුම අනු කොටස්වලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුර සපයන්න.
- I කොටස, II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාරදෙන්න.

## 1 කොටස

01.එක් එක් ප්‍රශ්නයට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා එයට හිමි අංකය වරහන තුළ ලියන්න.

1.1) ඝෝෂාක්ෂර පමණක් ඇතුළත් වරණය කුමක්ද?

i)ක,ච,ට,ග,ණ ii) ච,ට,ත,ෂ,බ
iii) ප,එ,ර,ළ,ෂ iv) අ,ඉ,ඌ,එ,ආ
v) හ, අඃ,ට,ම,ළ (......)

1.2) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

i) කළමණාකරණය, සංශ්ලේෂණ, දූෂ්පෝෂණ, කෘත්‍රිම
ii) කලමනාකරණය, සංස්ලේෂන, දූශ්පෝෂණ, කෘතිම
iii) කළමනාකරණය, සංශ්ලේශණ, දූශ්පෝෂන, කෘතිම
iv) කලමණාකරනය, සංෂ්ලේෂණ, දූෂ්පෝශණ, කෘත්‍රිම
v) කළමනාකරනය, සංස්ලේසණ, දූෂ්පෝසන, කෘතිම (......)

1.3) අකාරාදි පිළිවෙළ අනුව නිවැරදිව ලියා ඇති පද පේළිය තෝරන්න.

i) ක්වේට්, කොරියා, ස්වීඩනය, ස්පාඤ්ඤය, ගෞතමාලා
ii) ක්වේට්, කොරියා, ගෞතමාලා, ස්පාඤ්ඤය, ස්වීඩනය
iii) කොරියා, ක්වේට්, ස්වීඩනය, ස්පාඤ්ඤය, ගෞතමාලා
iv) ක්වේට්, ස්වීඩනය, කොරියා, ස්පාඤ්ඤය, ගෞතමාලා
v) කොරියා, ගෞතමාලා, ක්වේට්, ස්පාඤ්ඤය, ස්වීඩනය (......)

CamScanner

1.4) පහත ප්‍රකාශ අතුරින් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.

i) පාලි 'ශ' කාරය තත්සම පදවලදී 'ස' බවට පත්වේ.

ii) ච, ජ යන පාලි සංස්කෘත ශබ්ද සිංහලයට බිඳෙන විට එම අක්ෂර වෙනුවට 'ශ' යෙදේ.

iii) ර් හැර හල් අකුරකට පසුව යෙදෙන 'ය' වෙනුවට '**්‍ය**' (යංශය)භාවිත වේ.

iv) සමාන ස්වරයකින් ආරම්භ වන ශබ්ද ඇති විට ස්වර අනුපිළිවෙළට අකාරාදිය සැකසිය යුතුය.

v) නාම ධාතුක ක්‍රියා, අනවසාන ක්‍රියාවේ ප්‍රභේදයකි. (......)

1.5) එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

i) මිනිස් සිරුර, චන්ද්‍ර රශ්මිය, පෙරදිග අපරදිග, අක්ෂර වින්‍යාසය

ii) ශිලා ලේඛන, මහවැලි ගඟ, ජේෂ්ඨ පුතු,ක්ෂීර සාගරය

iii) සොබා ධමර්ය, ප්‍රේම ඇරයුම්, සතු වහර, මව්භාෂා

iv) පෙර ක්‍රියාව, සඳ රැස්, දළදා මන්දිරය, විරණ විධි

v) අක්ෂර වින්‍යාසය, විශ්‍රාම ශාලාව, වීණාවැයුම, පෙම් සාගරය (......)

1.6) තත්සම වචන පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

i ) අෂ්ඨාංග, දුහිතෘ, ප්‍රවේශ, විශ්‍රාම ii) මෘග, ත්‍රිපිටක, කුටිය, ගම්

iii) පිවිසීම, කර්තෘ, ශිලා, **වර්ණ** iv) වෙසක්, දහම, ජීවිත, මනුෂ්‍ය

v) මෘත, සිරුර, භාෂා, සොබා (......)

1.7) තද්භව වචන පමණක් **අන්තර්ගත** වරණය තෝරන්න.

i) පවන, මාත්‍රා, නැගි, ලෙව් ii) වියත්, කව්ලැකි, පහන්, ගාත්‍රා

iii) තියුණු, ගොයුම්, පමණ, සතර iv) සෙල්, පාෂාණ, නැව්, නෙත්

v) වන, ලතා, දන්ත, **ධර්ම** (......)

1.8) අවධි, කරණ, සම්ප්‍රදාන, කර්තෘ, යන විභක්තිවලට අයත් සමාස පද පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

i) මැටි බඳුන්, සතුරුබිය, පරපුටු, බුද්ධපූජා

ii) මැටිබඳුන්, සතුරුබිය, පරපුටු, බුද්ධ පූජා

iii) බුද්ධ පූජා, සතුරුබිය, මැටි බඳුන්, පරපුටු

iv) පර පුටු, බුද්ධ පූජා, මැටි බඳුන්, සතුරුබිය

v) සතුරුබිය, මැටි බඳුන්, බුද්ධපූජා, පරපුටු (.......)

1.9) කෘදන්ත පදයක් **අන්තර්ගත** නොවන වරණය තෝරන්න.

i) නටන්නා කාගෙත් නෙත් සිත් පිනවීය.

ii) ඔහුගේ විශේෂතා සැමට ප්‍රිය විය.

iii) සිහමන් යදින ඔහු සැබවින්ම ධනවතෙකි.

iv) රාජ්‍ය ලේඛනවල පැරණි ලියවිලි නැවත සැකසිය යුතුය.

v) කැවිලි රැසක් මේසය මත තිබුණි. (.......)

CS CamScanner

1.10) පහත සඳහන් උද්ධෘතවල යටින් ඉරක් ඇඳ ඇති පද අයත් **ක්‍රියාවර්ගය** පිළිවෙළින් **දක්වා** ඇති වරණය තෝරන්න.

අ)එසේ **වුවහොත්** හිමි　　　　ආ)අත් ලෙල **දිදී** විදුලිය **පබා**

ඇ)දත් කැකුළු **පාලා**　　　　ඈ) **යන්** මන් තොසින් මග තොරතුරු නියම දැන

i) අසම්භාව්‍ය ක්‍රියා, **පූර්ව** ක්‍රියා, අපරක්‍රියා, **ආශිර්වාද** ක්‍රියා

ii) අසම්භාව්‍ය ක්‍රියා, අපරක්‍රියා, **ආශිර්වාද** ක්‍රියා, විධි ක්‍රියා

iii) අපරක්‍රියා, **පූර්ව** ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, **ආශිර්වාද** ක්‍රියා

iv) විධික්‍රියා, අපර ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

v) අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, **පූර්ව** ක්‍රියා, විධි ක්‍රියා　　　　(.......)

1.11 තද්ධිත පදයක් නොවන පදයක් සහිත වරණය තෝරන්න.

I) කුසලතා, ගුරතා, ජනතා, මුදුතා　　　　ii) මිහිරිතම, අනගිතම, ප්‍රියතම, ස්ථිරතම

iii) මැණි, පුතණු, කාලීන, කොබ　　　　iv) ලාංකීය, වැසිය, ග්‍රාමීය, දේශීය

v) සෞඛ්‍ය, කාව්‍ය, පිටත්, ශ්‍රීමත්　　　　(.......)

1.12) උපසර්ගයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

i) අපිවර්ම, පරිගණක, සුවච, අතිධාවන　　　　ii) අධිකාර, උපමාන, උපමා, ප්‍රබන්ධ

iii) සංයුක්ත, සන්නාම, සංදර්ශන, සංවිධාන　　　　iv) සුදන, ආවේග, ආගම, ආදේශ

v) විමල, විශේෂ, යවන, විකෘති　　　　(.......)

1.13) නිපාතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

i) ගෙන්, කෙරෙන්, වෙන්, විසින්　　　　ii) හොත්, නම්, ද, අත

iii) ය, හෙවත්, කරා, දක්වා　　　　iv) යළි, පිණිස, වස්, ළග

v) පමණ, විතර, හා, අහා　　　　(.......)

1.14) "**ඉන්දියාවෙහි** ක්ෂේත්‍රතම **අපූර්ව** කාව්‍යයන්ගෙන් වැඩි සංඛ්‍යාවක් **පහළ** වූයේ අලංකාර වාදය පැතිරෙන්නට පෙරය". මෙහි යටින් ඉරක් ඇඳ ඇති පද අයත් වන ව්‍යාකරණ අංගය නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.

i) තද්ධිත පද, කෘදන්ත පද, අව්‍ය පද　　　　ii) අනුක්ත පද, විභක්ති පද, නිපාත පද

iii) විභක්ති පද, උපසර්ග පද, තද්ධිත පද　　　　iv) තද්ධිත පද, විභක්ති පද, උපසර්ග පද

v) විභක්ති පද, තද්ධිත පද, කෘදන්ත පද　　　　(.......)

1.15) සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියාරූප සහිත වරණය තෝරන්න.

i) නුතන, දෙතන, සදාතන, විරන්තන　　　　ii) නරඹ, කරනු, බඳිනු, හැඩිණි

iii) නටත, දකිත, කියත, මෝරත　　　　iv) පිපෙනා, වෙවා, සැරද, ගාවා

v) එනු, වඩිනු මැන, ජයතු, ඇදි　　　　(.......)

1.16) දකාරාර්ථ, අව්‍ය, විශේෂණ, විභක්ති හා අන්‍යාර්ථ සමාස සඳහා පිළිවෙළින් උදාහරණ දැක්විය හැකි පද ඇතුළත් වරණය තෝරන්න.

i) මුතුදසන්, බුදුබණ, සුවිසල්, සුරමග, බත්බුලත්

ii) බත්බුලත්, සුවිසල්, මුතුදසන්, බුදුබණ, සුරමග

iii) බුදුබණ, සුවිසල්, මුතුදසන්, සුරමග, බත්බුලත්

iv) සුවිසල්, මුතුදසන්, බත්බුලත්, සුරමග, බුදුබණ

v) සුරමග, බුදුබණ, බත්බුලත්, මුතුදසන්, සුවිසල් (.......)

1.17) යටින් ඉරක් ඇඳ ඇති පද අයත්වන සන්ධි පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

අ) සබඳ අපි කඳු නොවෙමු **උනුන්** පරයා නැගෙන

ආ) **සින්දූපමාන** වැව් තලා මතින් නැගී

ඇ) කරසක පොළොව **නිරුදක** මරු වැලි කතර

ඈ) **ළිංතොට** ගංතොට ආදි තැනේයා

i) ස්වර සන්ධිය, ස්වරාදේශ සන්ධිය, ආගම සන්ධිය, ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය

ii) පරස්වර ලෝප සන්ධිය, ස්වරාදේශ සන්ධිය, ස්වර සන්ධිය, ගාත්‍රාදේශ සන්ධිය

iii) පූර්වස්වර ලෝප සන්ධිය, ස්වර සන්ධිය, පරරූප සන්ධිය, ආගම සන්ධිය

iv) ස්වර සන්ධිය, පරස්වර ලෝප සන්ධිය, ආගම සන්ධිය, ද්විත්ව රූප සන්ධිය

v) පරස්වර ලෝප සන්ධිය, පූර්ව රූප සන්ධිය, ආගම සන්ධිය, පර රූප සන්ධිය (.......)

1.18) ව්‍යාකරණානුකූලව නොගැළපෙන පදයක් සහිත වරණය තෝරන්න.

i) රුවැති, දිනිඳු, සියැසින්, උදරාබාධ

ii) ලේනි, තරුණි, රැජිනි, යකිනි

iii) ගැමි, කුලීන, රුසියානු, දේශීය

iv) එම්බා, කොල, ඇයි, කෙල්ල

v) අපවාද, ප්‍රගමනය, අනුදත්, ඔවදන් (.......)

1.19) ව්‍යාකරණානුකූලව නිවැරදි වැකිය තෝරන්න.

i) කලාකරුවෝ දෙදෙනෙකු සම්මාන ලැබූහ.

ii) චන්ද්‍ර තොමෝ බැස ගියේය.

iii) පියා විසින් දරුවෝ සුරැකෙයි.

iv) අක්කාද ඔබද මමද උත්සවයට සහභාගි වූහ.

v) ප්‍රදර්ශනය පෙ.ව.4.00 ට අවසන් වෙයි. (.......)

1.20) ලේඛන ව්‍යවහාරයට වඩාත්ම සුදුසු වාක්‍ය තෝරන්න.

i) එන්න මද නලේ ගොස් පවසන්න දූක මගේ

ii) ඔබ ද මා ද විය මා ද ඔබ ද විය.

iii) මලට බඹරකු සේ සිතට ඔබ එනවා.

iv) මම් කෙසේ පවසම් කෙසේ සුර ළඳුන් දුන් රඟ සොබා.

v) පුතුනි, බලන් යොමා නුවන් කවුරුද එන්නේ. (.......)